# පුරප්පාඩු

# පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

ලෝක බැංකු ණය ආධාර මත වසර පහක කාලයකට ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2016 ට අනුව ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය **කොන්ත්‍රාත් පදනම මත** බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් වයස අවුරුදු 60 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, රජයේ නීති රෙගුලාසි පිළිබඳ දැනුම සහ පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවයන් වේ.

**1. ප්‍රසම්පාදන විශේෂඥ - තනතුරු 01**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව )UGC) විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම **හෝ** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියකට සමාන අධ්‍යාපන සුදුසුකමක් පිළිගත් ආයතනයකින් සපුරා තිබෙන බවට සහතික කර තිබීම **හෝ** පිළිගත් වෘත්තීය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීයමය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම **සහ** අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 4ක් ඇතුලත්ව කළමනාකරණ මට්ටමෙහි වසර 8ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ උපාධියක් **සමඟ** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම **හෝ** අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් උපාධියක් **සමඟ** පිළිගත් වෘත්තීමය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීමය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම **සහ** අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ අවුරුදු 6ක පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

රජයේ දීප ව්‍යාප්ත සේවාවක පළමුවෙනි (I) ශ්‍රේණියේ නිලධාරියෙකු වීම **සහ** එම ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ වසර 5ක පළපුරුද්දක් ලබා තිබීම

ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව ප්‍රසම්පාදන කළමනාකරණය / කොන්ත්‍රාත් කළමනාකරණය සහ සියලු ආකාරයේ ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කිරීම පිළිබඳ පළපුරුද්දක් තිබීම හා විදේශ ආධාර සපයන ව්‍යාපෘතිහී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් අත්දැකීම් ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් හිමි වනු ඇත.

**ප්‍රසම්පාදන විශේෂඥ තනතුර සඳහා වයස් සීමාව - අවුරුදු 63 ට අඩු**

**වැටුප් පරිමාණය: PS3- රු.125,000.00 – 140,000.00 ***

**2. ප්‍රසම්පාදන නිලධාරී - තනතුරු 01**

**3. සමාජ සංවර්ධන නිලධාරී - තනතුරු 02**

**4. පරිසර නිලධාරී - තනතුරු 01**

**ඉහත තනතුරු 2, 3, සහ 4 සඳහා සපුරා තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව )UGC) විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම **හෝ** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියකට සමාන අධ්‍යාපන සුදුසුකමක් පිළිගත් ආයතනයකින් සපුරා තිබෙන බවට සහතික කර තිබීම **හෝ** පිළිගත් වෘත්තීය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීයමය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම **හෝ** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු

ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් හත්වන (7) මට්ටමේ කුසලතා සහතිකයක් ලබා තිබීම **සහ** අදාළ ක්ෂේත්‍රයේ වසරක (1) පලපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් හයවන (6) මට්ටමේ කුසලතා සහතිකයක් ලබා තිබීම **සහ** අදාළ ක්ෂේත්‍රයේ වසර 6ක පලපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් පස්වන (5) මට්ටමේ කුසලතා සහතිකයක් ලබා තිබීම **සහ** අදාළ ක්ෂේත්‍රයේ වසර 11 පලපුරුද්දක් ලබා තිබීම.

ප්‍රසම්පාදන නිලධාරී තනතුර සඳහා අයදුම්කරු, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව සියලු ආකාරයේ ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කිරීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 01 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය - PS6 - රු.52,000.00 – 57,000.00 ***

* කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2016 ට අනුව ඉහත සඳහන් කර ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**අයදුම් කිරීම :**

අයදුම්කරුවන් විසින් ඥාතීන් නොවන, ඔහු / ඇය පිළිබඳ නිර්දේශයන් ලබාගත හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන්ද ඇතුලත්ව තම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සඳහන් කරමින් සිය ජීව දත්ත පත්‍රිකාවත් අයදුම්පත සමග යොමු කල යුතුය. සුදුසුකම් හා සේවා පලපුරුද්ද පදනම් කර ගනිමින් තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් සිදුකරන අතර අයදුම්කරුවන්ගේ කුසලතාවන්ගේ ප්‍රමුඛතාවය මත බඳවා ගැනීම් සිදුකරනු ලබයි. එබැවින්, බඳවා ගැනීමේ ක්‍රියාවලිය සඳහා කිසියම් බලපෑමක් හෝ නියෝජනයක් කිරීම මගින් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය. මූලික සුදුසුකම් තහවුරු කරගැනීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවීම අනිවාර්ය වන අතර සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා / ආයතන ප්‍රධානියා හරහා, සම්පූර්න කල අයදුම්පත් **2018 ඔක්තෝබර් 01** වන දිනට **හෝ** ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත් බහා එවන **ලියුම් කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කල යුතුය.**

තනතුරට අදාළ රාජකාරි විස්තරය සඳහා www.mmde.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**ලේකම්**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**
**අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ අංශය**
**"සොබාදම්පියස"**
**නො. 416/C /1,**
**රොබට් ගුණවර්ධන මාවත,**
**බත්තරමුල්ල**
2018 සැප්තැම්බර් මස 16 වන දින